විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ශ්‍රේණිය - 10

මාසය - ඔක්තෝබර්

සතිය - 1

7 – පැතුරුම්පත් භාවිතයෙන් සරල සංඛ්‍යානමය ගැටළු විසඳයි.

7.6 - සාපේක්ෂ හා නිරපේක්ෂ කෝෂ යොමුව යෝග්‍ය පරිදි භාවිතා කරයි.

ශිෂ්‍ය කාර්යය

01. පහත වැඩපත පැතුරුම්පත් මෘදුකාංගයේ වැඩපතක් තුළ ඇතුළත් කරන්න.

| | A | B | C |
|---|---|---|---|
| 9 | price of a book | quantity | total price |
| 10 | 10 | 1 | |
| 11 | | 2 | |
| 12 | | 3 | |
| 13 | | 4 | |
| 14 | | 5 | |
| 15 | | 6 | |
| 16 | | 7 | |

02. A 10 තුළ ඇත්තේ පොතක මිල රු. 10 ක් බවයි. B තීරුවේ දැක්වෙන්නේ එම මිල යටතේ මිලදී ගනු ලබන විවිධ පොත් ප්‍රමාණයන්ය. C තීරුවේ දැක්වෙන්නේ එම ප්‍රමාණ හා මිල යටතේ ලබා ගත් විට ගෙවිය යුත් මුදලයි.

සූත්‍ර පිළිබඳ ඔබේ දැනුම භාවිතා කර C 10 සිට C 16 දක්වා අදාළ වන සූත්‍ර වෙන වෙනම ඇතුළත් කර පිළිතුරු ලබා ගන්න.

උදා - C 10 තුළ = A10 * B 10 ඇතුළත් කරන්න.

03. ඉහත පරිදි ඔබට ලැබෙන පිළිතුරු නිවැරදි වුවද නැවත නැවත සූත්‍ර ඇතුළත් කිරීමට සිදු වීම අවාසියකි. ඒ බව නිරීක්ෂණය කරන්න.

ඒ අනුව C 10 තුළ = A10 * B 10 ඇතුළත් කර පසුව පිරවුම් හැඩලය මගින් පහළට ඇදගෙන යාමෙන් සූත්‍ර පිටපත් කිරීම C16 දක්වා කරගෙන යන්න. (පිරවුම් හැඩලය - C10 කෝෂයේ දකුණු පස කෙළවර)

| | A | B | C |
|---|---|---|---|
| 9 | price of a book | quantity | total price |
| 10 | 10 | 1 | =A10*B10 |
| 11 | | 2 | |
| 12 | | 3 | |
| 13 | | 4 | |
| 14 | | 5 | |
| 15 | | 6 | |
| 16 | | 7 | |

04. එවිට පහත පරිදි පිළිතුරු ලැබුණද ඒවා නිවැරදි නොවන බව අවබෝධ කර ගන්න. මෙසේ නිවැරදි නොවීමට හේතුව වන්නේ එකම තීරුවක් දිගේ සූත්‍ර පිටපත් කිරීමේදී සූත්‍රයේ ඇති පේළි අංක අනුයාතව වෙනස් වීමයි.

| | A | B | C |
|---|---|---|---|
| 9 | price of a book | quantity | total price |
| 10 | 10 | 1 | =A10*B10 |
| 11 | | 2 | =A11*B11 |
| 12 | | 3 | =A12*B12 |
| 13 | | 4 | =A13*B13 |
| 14 | | 5 | =A14*B14 |
| 15 | | 6 | =A15*B15 |
| 16 | | 7 | =A16*B16 |

මේ තත්වය වෙනස් කර ගැනීමට උපක්‍රමයක් දැන් සිතා බලමු. = A10 * B10 යන සූත්‍රයේ පළමු කොටස A11, A12, A13 ආදි ලෙස වෙනස් වී ඇත. මෙසේ වෙනස්වීම සිදුවීම වරදක් බව අවබෝධ කර ගන්න. (මිල සඳහන්ව ඇත්තේ A10 තුළ පමණි)

නමුත් සූත්‍රයේ දෙවන කොටස වෙනස්වීම ගැටළුවක් නොවන බවද නිරීක්ෂණය කරන්න. (ප්‍රමාණය විවිධ සෙල් ලිපින වල ඇතුළත්ව ඇත)
මෙවැනි අවස්ථාවක මෙසේ වෙනස් වන සෙල් ලිපින සාපේක්ෂ සෙල් ලිපින ලෙස හඳුන්වයි.
මිල සඳහන්වන තීරුවේ මෙම සූත්‍රයේ වෙනස් වී ඇත්තේ සූත්‍රයේ පේළි අංකයයි. පිටපත් කිරීම එකම තීරුව දිගේ කළ නිසා තීරුව වෙනස් වී නැති බව නිරීක්ෂණය කරන්න. එසේනම් මෙවැනි විටෙක වෙනස් වන අකුර හෝ ඉලක්කමට පෙර $ සංකේතය යෙදීමෙන් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැක.
මේ සඳහා පහත සූත්‍රය C10 තුළ ඇතුලත් කර පෙර පරිදි පිටපත් කරන්න. පිළිතුරු හොඳින් පරීක්ෂා කරන්න.
= A$10 * B10
පහත සූත්‍රය ද වලංගු වේ.
= $A$10 * B10

| | A | B | C |
|---|---|---|---|
| 9 | price of a book | quantity | total price |
| 10 | 10 | 1 | =A$10*B10 |
| 11 | | 2 | =A$10*B11 |
| 12 | | 3 | =A$10*B12 |
| 13 | | 4 | =A$10*B13 |
| 14 | | 5 | =A$10*B14 |
| 15 | | 6 | =A$10*B15 |
| 16 | | 7 | =A$10*B16 |

මෙහිදී $ සංකේතය මගින් කර ඇත්තේ සූත්‍ර පිටපත් කිරීමේදී සෙල් ලිපින වෙනස්වීම වළක්වා ගැනීමයි. සූත්‍ර හෝ ශ්‍රිත පිටපත් කිරීමේදී වෙනස් නොවන සෙල් ලිපින සාපේක්ෂ සෙල් ලිපින වන අතර නෙවස් වන සෙල් ලිපින නිරපේක්ෂ සෙල් ලිපින වේ.

මෙහිදී අපි සලකා බැලුවේ තීරුවක් නිරපේක්ෂ වන අවස්ථාවකි.

- ඔබගේ කියවීම් පොතේ 228, 229, 230, 231, සහ 232 හොඳින් කියවා තේරුම් ගන්න.

- මෙහි දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම් පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.

- ඔබ සතුව පරිගණකයක් තිබේ නම් කියවීම් පොතේ 228, 229, 230, 231, සහ 232 අදාළ ක්‍රියාකාරකම් කරන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කර ගතහැකි ඉගෙනුම් ආධාරක**

- ගුරු ගෙදර - https://www.youtube/GUNOFJ-YrX4
- e-නැණපියස - https://www.enenapiyasa.lk

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල**

- සාපේක්ෂ හා නිරපේක්ෂ කෝෂ ලිපින යෙදීම පැහැදිලි කරයි.
- ගැටලු විසඳීමේ දී යෝග්‍ය පරිදි ඉහත ආකාර දෙක යොදා ගනියි.